**IPRC/16/150**

# පශ්චාත් යුධකාලීන ශ්‍රී ලංකාව තුළ ජාතිය ගොඩනැංවීමෙහිලා ආගමික සංවිධානයන්හි බලපෑම පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

කේ. එම්. ඩී. සී. ප්‍රසාදි[1*]

ජාතිය,ආගම,භාෂාව,කුලය,වර්ගය හෝ සංස්කෘතිය අනුව බෙදී සිටින ජනවර්ග අතර පවතින්නා වූ ගැටලු නිරාකරණය කර, ඔවුන් සියලුදෙනා සමාන අයිතිවාසිකම් ඇති සහ සමාන මනුෂ්‍ය ගෞවරයක් ඇති මිනිසුන් බවට පත්කරන වැඩපිළිවෙලක් තුළ, තමන් ජීවත්වන දේශය මුල්කර ගත් දේශාභිමානයකින් ද, සාමයෙන් ද, එකිනෙකා කෙරෙහි ගොඩනගා ගත් ආදරය සහ ගෞරවයෙන් ද ක්‍රියාකරන ශ්‍රී ලාංකීය ජාතියක් ප්‍රතිනිර්මාණය කිරීම, ශ්‍රී ලංකාවේ දේශපාලන සන්දර්භය තුළ ජාතිය ගොඩනැංවීම ලෙස සැළකිය හැකිය. වර්තමානය වන විට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක හා ජාතික රාජ්‍යයේ පැවැත්ම සඳහා එක්සත් ජාතියක් බිහිකර ගැනීම මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී සාක්ෂරතාවයක් සහිත සමාජ ක්‍රමයක් නිර්මාණය කරගැනීම සඳහා ශ්‍රී ලංකාවට අවශ්‍යව තිබුණ ද, එම අවශ්‍යතාවය සපුරා ගැනීමට වර්තමානය වන විට නොහැකි වී ඇත.

මෙම අවශ්‍යතාවය සපුරාගැනීමේ දී ආගමික සංවිධානවල ක්‍රියාකාරිත්වය ජාතිවාදී මුහුණුවරක් ගෙන ක්‍රියාකරන බවට චෝදනා එල්ල වන්නේ ඇයි? යන්න අධ්‍යයන ගැටලුව ලෙස සකසා ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. මෙම අධ්‍යයනයේ දී මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් නීලමහර ග්‍රාමීය ප්‍රදේශයෙන් පුද්ගලයින් 210 ක් සරල සසම්භාවී නියැදි ක්‍රමයයට තෝරාගෙන එනම් 20% ක් තුළින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. එහි දී ජාතිය ගොඩනැංවීම සඳහා ආගමික සංවිධානයන්හි කාර්යභාර්ය, බලපෑමේ ස්වරූපය පිළිබඳ විමසන ලදී. ඊට අමතරව ආගම් සංවිධානයන්හි ස්වරූපය, ජාතිවාදී මුහුණුවරක් ගැනීම සම්බන්ධව තවදුරටත් මෙම අධ්‍යයනයේ දී විමසන ලදී. මේ සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත රැස් කිරීම සිදු කළ අතර වගු, ප්‍රස්ථාර යනාදී විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ දත්ත ඉදිරිපත් කිරීම සිදු කරන ලදී. ඒ අනුව අන්‍යාගමිකකරණය, මූලධර්මවාදී ක්‍රියාකාරකම් සහ ආගම් පදනම් කරගත් අන්තවාදී සංවිධාන බිහිවීම නිසා ඒවායේ ක්‍රියාකාරිත්වයේ අනිටු ප්‍රතිඵල ජාතිය ගොඩනැංවීමට බාධාවන හෙයින්, ආගමික නායකයින් සහ සංවිධාන සෘජුව ඊට මැදිහත්වීම සහ ඒවාට ප්‍රතිචාර දක්වන්නට යාමේ දී, ජාතිය ගොඩනැංවීමේ ක්‍රියාකාරිත්වය පසුගාමී වී ඇතිබව මෙහි මූලික නිගමනය විය. මෙහිදී ආගමික නායකයන් සහ සංවිධාන තම පෞද්ගලික මතවාදයන්ගෙන් බැහැරව සහ මූලික අරමුණ වූ ජාතිය ගොඩනැංවීම සඳහා පමණක් ක්‍රියාත්මක වීම හරහා මීට විසඳුම් ලබාගත හැක.

***ප්‍රමුඛ පද:*** *බෞද්ධ ආගම, ජාතිය ගොඩනැංවීම, ප්‍රජාතන්ත්‍රවාදය, ආගමික සහජීවනය, ජාතික රාජ්‍ය*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව *prasahas@gmail.com